පන්විල ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිලිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 11 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සභා කාර්යාලය ඉදිකර ඇති සභාව සතු ඉඩම හා උඩුගොඩ 4 සුසාන භූමිය තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී හුළුගඟ නැරඹුම් මැදිරිය ඉදිකිරීමට දරා තිබුණු රු.1,190,406 ක වියදමින් රු.237,606 ක් වටිනාකම වූ යකඩ වැට ඉවත් කිරීම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර නොතිබුණි.

(ඇ) විදුලිබල අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලබා දී තිබුණු රු.680,000 ක් වටිනාකම වූ සූර්ය පැනලය ගිණුම්ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබුණු රු.129,500 ක වටිනාකම වූ ලී බඩු හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) 2015 වර්ෂය සඳහා ත්‍රී රෝද රථ නැවතුම්පල ආදායම් ලෙස ලැබුණු රු.22,000 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයේ විගණන ගාස්තුව වූ රු.119,370 ක මුදල පිළිබඳව නොසලකා, සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තුව ලෙස රු.50,000 ක් ගිණුම් ගතකර තිබුණි.

(උ) ඉකුත් වර්ෂවල මුද්දර ගාස්තු ආදායම ලෙස ලැබී තිබූ රු.1,200,000 ක මුදල පිළිබඳව නොසලකා සමාලෝචිත වර්ෂයේ මුද්දර බදු ආදායම ලෙස රු.200,000 ක් ගිණුම්ගත කර තිබූ අතර, ලැබිය යුතු ආදායමද නිවැරදිව ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 අසම්භාව්‍ය බැරකම්

-----------------------

කර්මාන්ත හා ව්‍යාපාර බදු නොගෙවීම සම්බන්ධයෙන් පාර්ශවකරුවන් 9 දෙනෙකුට විරුද්ධව සභාව විසින් අධිකරණයේ නඩු ගොනුකර ඇතත්, ඒ පිළිබඳව ගිණුම් සටහන් මගින් අනාවරණය කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 2 ක එකතු වටිනාකම රු.16,860,878 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.255,316 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.2,022,507 ක් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතු වටිනාකම රු.19,399,534 ක් විය. ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ නිරවුල් නොකල ශේෂ එකතුව රු.1,283,384 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.2,610,914 ක් වී තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

-------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,029,426 ක් වූ ගනුදෙනු 2 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | **රු.** | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | |
| | (i) 126 (vii) ඊ හා (xxx) උප වගන්ති | 234,221 | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කරනු ලබන සියලුම දැන්වීම් පුවරු වලින් ගාස්තු අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (ii) 149 වගන්තිය | - | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයකින් සියයට 1 දක්වා වූ බදු මුදල අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ | | |
| | (i) 32 උප වගන්තිය | - | අදාළ උපදෙස් නොසලකා පෞද්ගලික ගව ඝාතකාගාරයක් පවත්වාගෙන යාමට අවසර දී තිබුණි. |
| | (ii) 20 උප වගන්තිය | - | අදාළ උපදෙස් නොසලකා මස් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාමට අවසර දී තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | 72,000 | බැකෝ යන්ත්‍රයක් අනතුරට පත්වී අලාභයක් සිදු වී තිබුණද ඒ සම්බන්ධව පරීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඈ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:8:1 | - | හුළුගහ නැරඹුම් මැදිරිය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කමිටුව සඳහා විශේෂඥතාවයක් දක්වන පුද්ගලයන්ගේ සහාය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,648,584 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,219,513 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්
----------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,438,000 | 1,509,306 | 1,316,746 | 379,104 | 937,000 | 975,513 | 741,028 | 411,716 |
| කුලී | 1,077,571 | 1,143,548 | 1,106,579 | 42,750 | 995,140 | 1,031,577 | 987,483 | 59,697 |
| බලපත්‍ර ගාස්තු | 2,226,000 | 2,970,946 | 2,941,946 | 37,000 | 1,296,000 | 2,500,879 | 2,488,879 | 20,000 |
| වෙනත් ආදායම් | 1,719,800 | 2,273,795 | 1,397,710 | 1,055,090 | 2,048,800 | 1,896,457 | 853,359 | 1,431,974 |
| | 6,461,371 | 7,897,595 | 6,762,981 | 1,513,944 | 5,276,940 | 6,404,426 | 5,070,749 | 1,923,387 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු පන්විල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවාගෙන තිබුණද තක්සේරුව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ ඇති පෞද්ගලික ආයතන, හෝටල් සහ වෙළඳසැල් වලින් කසළ බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 හා 2016 වර්ෂවල යන්ත්‍රෝපකරණ ඒකකය සඳහා ලබාදුන් වාහන වලින් ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 වරිපනම් හා බදු

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.327,616 ක් විය. එම ශේෂයට වර්ෂ 1 සිට 5 දක්වා අතර කාලයක් ඉක්මවූ රු.139,913 ක හා වර්ෂ 5 කට වැඩි කාලයක් ඉක්මවූ රු.19,323 ක ශේෂ ඇතුළත් විය.

(ආ) අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.51,489 ක් හා සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම රු.38,289 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර තිබුණේ පිළිවෙලින් රු.19,634 ක් හා රු.29,658 ක් පමණි. වර්ෂයේ ආරම්භක හිඟයෙන් රු.41,619 ක් වර්ෂ 5 ඉක්මවා තිබුණි.

2.2.4 වෙනත් ආදායම්

(අ) ජල ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු රු.226,570 ක් වූ අතර, ඉන් රු.67,245 ක් වර්ෂ 1 සිට 5 දක්වා අතර කාලයකට අදාළ විය.

(ආ) ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු

------------------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟහිටි ත්‍රීරෝද රථ නැවතුම්පල ගාස්තු ශේෂය රු.288,050 ක් හා වර්ෂයේ බිල් කිරීම් රු.167,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අයකර තිබුණේ පිළිවෙලින් රු.71,025 ක් හා රු.114,300 ක් පමණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.91,076 ක් ලැබිය යුතුව තිබූ අතර, මුද්දර ගාස්තු ආදායම ඇස්තමේන්තු පදනමින් හෝ ගිණුම්ගත කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා කිසිවක් පනවා නොතිබුණි.

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

----------------------------

පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

හුළුගහ නැරඹුම් මැදිරිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ සම්පූර්ණ ඇස්තමේන්තු මුදල රු.8,207,466 ක් වූ නමුත්, එකී ඇස්තමේන්තුවේ රු.2,907,663 ක් වටිනා වැඩ විෂයන් 13 ක වැඩ නිමකර නොතිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ අධීක්ෂණය ඉතාම දුර්වල මට්ටමක පැවතුණි.

(ඈ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come)ලබා නොගැනීම

-----------------------------------------------------

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ කාර්යයන් 2 ක් ඉටු කිරීම සඳහා රු.6,904,748 ක් වැය කර අපේක්ෂිත නිමවුම් මට්ටම (out put) අත්පත් කරගෙන තිබූ නමුත් අපේක්ෂිත ප්‍රතිලාභ (out come) අත්පත් කරගෙන නොතිබූ අවස්ථා පහත දැක්වේ.

| කර්තව්‍යයන් | 2017 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුදල | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| (i) නකල්ස් නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා සුව පහසුකම් සැපයීමට ඉදි කර තිබුණු මධ්‍යස්ථානය | 4,404,748 | මෙම ව්‍යාපෘතිය ඉදිකර වසරකට වැඩි කාලයක් ගත වී ඇතත්, ප්‍රයෝජනයට ගෙන ආදායමක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) සතිපොළ ගොඩනැගිල්ල | 1,500,000 | මෙම ගොඩනැගිල්ලේ වැඩ අවසන් කර මාස 27 ක කාලයක් ගතවී තිබුණද නිෂ්කාර්යව පැවතුණි. |
| | 6,904,748 | |

(ඉ) අත්හැර දැමූ කර්තව්‍යයන්

සමාලෝචිත වර්ෂයේදී කර්තව්‍යයක් ආරම්භ කර ඒ සඳහා රු.1,834,580 ක් වැයකර තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. විස්තර පහත දැක්වේ.

| කර්තව්‍යය | 2017 දෙසැම්බර් 31 දක්වා වැය කළ මුදල | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| සභා කාර්යාල ගොඩනැගිල්ල හා පුස්තකාල ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම හා නවීකරණය | 1,834,580 | රු.3,288,855 කට ටෙන්ඩරය පිරිනමා ඇතත්, කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රු.1,834,580 කට ව්‍යාපෘතිය නිම කර තිබුණි. |

(ඊ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්

සමාලෝචිත වර්ෂයේදී කර්තව්‍යයන් 5 ක් ඉටු කිරීම සඳහා රු.1,164,895 ක ප්‍රතිපාදන සලසා ගෙන ඇතත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| | කර්තව්‍යය | ඇස්තමේන්තු ගත මුදල | නිරීක්ෂණ |
|---|---|---|---|
| | ------------ | ---------------- | --------------- |
| | | රු. | |
| (i) | මාඋස්සාව වත්තේ ඉහළ කොටසේ තේ කර්මාන්ත ශාලාවේ සිට පිට්ටනිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 978,895 | ලියාපදිංචි සමිතියක් ඉදිරිපත් නොවීම |
| (ii) | පන්විල, උඩුගොඩ, කලගොල්ල අංක 30/1 ලිපිනයෙහි පදිංචි ප්‍රතිලාභියෙකුට රියදුරු බලපත්‍ර ලබාදීම | 15,000 | ව්‍යාපෘතිය අවලංගු කිරීම |
| (iii) | මඩුල්කැලේ අරත්තන 18 කණුව හි පදිංචි අඩු ආදායම්ලාභී ප්‍රතිලාභියෙකුට නිවස සෙවිලි කිරීමට තහඩු ලබා දීම | 6,000 | ප්‍රතිලාභියා විසින් අවශ්‍ය විස්තර ලබාදී නොතිබීම |
| (iv) | හුළුගහ අලකොලවත්ත ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම | 150,000 | ව්‍යාපෘතිය අවලංගු කිරීම |
| (v) | දෙහිමඩිත්ත උදුම්බරාගිරි මරණාධාර සමිතියට ඉවුම් පිහුම් කට්ටලයක් ලබා දීම | 15,000 | සමිතිය ලියාපදිංචි වී වසර 02 ක් ගතවී නොතිබීම |
| | | ------------- | |
| | | 1,164,895 | |
| | | ======== | |

(උ) සන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් දිනකට ටොන් 01 ක පමණ කසළ ප්‍රමාණයක් එකතු කර, සතියකට දිනක් කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව වෙත ලබාදීම සිදු කරමින් තිබූ අතර, නොදිරන කසළ මෙන්ම අනෙකුත් කසළ හාතලේ ඉඩමට හා හුළුගහ සෙන්ජෝන්ස් හීල් ඉඩමට ක්‍රමවේදයකින් තොරව බැහැර කර තිබුණි. කසළ බැහැර කරන මෙම ඉඩම් ප්‍රධාන මාර්ගය දෙපස පවතින අධික බෑවුම් සහිත ප්‍රදේශ වන අතර, කසළ බැහැර කිරීම නිසා නායයෑම් වැනි ස්වභාවික විපත් සඳහා වැඩි අවදානම් තත්ත්වයක් පැවතුණි. නකල්ස් රක්ෂිතය ආශ්‍රිතව කසළ බැහැර කිරීම පරිසර දූෂණයට මූලික හේතුවක් වී තිබුණි.

(ඌ) තිරසාර සංවර්ධනය

------------------------

සභාව විසින් තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ රු.25,000 ක මුදලක් අයකර ප්‍රචාරක කටයුතු සඳහා ලබා දී තිබුණු හෝරාස්ථම්භය සඳහා 2017 වර්ෂයේදී රු.20,000 ක වාර්ෂික ගාස්තුවක් අය කිරීම නිසා සියයට 20 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරන ජල ව්‍යාපෘති 07 ක ව්‍යාපාරික ජල සැපයුම් 370 ක් සඳහා ජලමනු සවිකර නොතිබූ අතර, ගෘහස්ථ සැපයුම් වෙනුවෙන් රු.200 ක ස්ථාවර මාසික ගාස්තුවක් අයකර තිබුණි.

(ඇ) හුළුගඟ ප්‍රදේශය ආශ්‍රිතව හිස් බිම්කට්ටි 08 ක් පුද්ගලයන් 08 දෙනෙකුට 1982 වර්ෂයේ සිට බදු පදනම මත ලබාදී තිබුණු අතර, සභාව විසින් බදු සංශෝධනයක් හා බදු ගිවිසුම් අළුත් නොකර වර්ග අඩියකට රු.30 බැගින් දීර්ඝකාලීනව බදු අය කර තිබුණි. බිම් කට්ටිවල සීමා මායිම් නිශ්චිත නොවූ අතර, සභාව විසින් සීමා මායිම් නිරවුල් කර දීමටද කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

(අ) සේවක පුරප්පාඩු

---------------------

අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩල අතර, තනතුරු 4 ක සේවක පුරප්පාඩු 7 ක් විය. කළමනාකරණ සහකාර සේවයේ I පංතියේ නිලධාරියෙක් ලේකම් තනතුරේ වැඩ ආවරණය කරමින් තිබුණි.

(ආ) සේවක ණය

----------------

ස්ථාන මාරුවී ගිය සහ සේවය අවසන් කරන ලද සේවකයින් දෙදෙනෙකුගේ පිළිවෙලින් රු.3,638 ක හා රු.12,600 ක ණය ශේෂ අයකරගෙන නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

----------------------------------

රු.10,800,000 ක් වටිනා හුළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ ඇස්තමේන්තු නිර්දේශ කිරීම හා නැවත පරීක්ෂා කිරීම සිදු කර තිබුණු නිලධාරීන් දෙදෙනා විසින් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සම්බන්ධ කමිටු නිර්දේශය ලබා දීම නිසා එහි විනිවිදභාවය හා පිළිගත හැකිභාවය පිළිබඳව විගණනයේදී සෑහීමට පත් වීමට නොහැකි විය.

3.5 වත්කම් කළමනාකරණය

------------------------------

3.5.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

(අ) රු.24,880,000 ක් වටිනා ඩම්ප් ට්‍රක් රථය හා බැකෝ යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) සභාවට අයත් වාහන 3 ක් වර්ෂ 2 ½ සිට 12 දක්වා කාලයක් තුළ කිසිදු ප්‍රයෝජනයට නොගෙන කාර්යාල භූමියේ ගාල්කර තිබුණි.

3.6 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පළාත් පාලන දෙපාර්තමේන්තුවට අනුයුක්තව ඉංජිනේරුවරයෙකු සිටියදී ඔහුගේ සේවය ලබා නොගෙන හුළුගඟ නැරඹුම් මැදිරියේ වැඩ නිම කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සැකසීම හා ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය ආදී සියළු කාර්යයන් පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවට ලබා දීම නිසා රු.410,373 ක් ගෙවිය යුතුව තිබුණි.

3.7 අවිධිමත් ගනුදෙනු
-----------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමැතියකින් තොරව 2017 ජූලි, අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස වෙනුවෙන් කසළ කම්කරුවෙකුගේ සේවය ලබාගෙන රු.58,410 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා සහභාගී වූ බවට කිසිදු ලිඛිත සාක්ෂියක් නොතිබියදී රු.13,698 ක මුදලක් ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත ගෙවා තිබුණි.

3.8 ප්‍රසම්පාදනය
-----------------

3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම
------------------------
සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් රු.12,042,280 ක භාණ්ඩ හා සේවා මිලදීගෙන තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.8.2 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------
හුළුගහ නැරඹුම් මැදිරියේ ඉතිරි වැඩ නිම කිරීම හා භූමි අලංකරණය කිරීම
-------------------------------------------------------------------------------
2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ හුළුගහ නැරඹුම් මැදිරියේ ඉතිරි වැඩ නිමකිරීම හා භූමි අලංකරණය කිරීම පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට රු.7,569,220 ක මුදලකට පවරා රු.6,234,085 ක නිමි වැඩ වටිනාකමක් මත රු.5,197,560 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 14 යටතේ පඩිපෙලට යොදනු ලබන අත්වැට හා වැඩ විෂය අංක 41 ප්‍රකාරව භූමි අලංකරණය සඳහා රේටයක් ඇතුළත් කළ හැකිව තිබියදී, ඒ සඳහා පිළිවෙලින් රු.1,700,000 ක හා රු.1,000,000 ක අයිතමයක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. SSR 4 (4) යටතේ තණ පිඩලි සඳහා රු.61,207 ක් හා ශ්‍රමිකයන් 17 දෙනෙකු සඳහා රු.22,525 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර, තණ පිඩලි සඳහා වතුර දැමීම හා නඩත්තු කර නොතිබියදී රු.119,250 ක් ගෙවා තිබුණි. SSR 4 (6) යටතේ වීජී පඳුරු පැළ 80 ක් මිලදී ගැනීම හා අදාළ කාර්යයන් සිදුකර නොතිබියදී රු.119,000 ක් ගෙවීම් කර තිබුණි. SSR 4 (7) යටතේ BSR නොවන අයිතම ලෙස මුළු එකතුවෙන් සියයට 20 ක් ලෙස රු.130,960 ක මුදලක් එකතු කර තිබුණු අතර, එය වැඩිපුර ගෙවීමක් විය.

(ii) ඇස්තමේන්තුවේ විෂයය අංක 33 ප්‍රකාරව ප්‍රධාන මාර්ගයේ බැම්මට පිරිවිතර අනුව ෆිල්ටර් ඒරියා සකස් කර නිසි පරිදි ප්‍රමිතියට අනුකූලව weep holes සකස් කිරීම සිදුකර නොතිබුණු අතර, weep holes 60 ක් සඳහා රු.34,260 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) අතිරේක වැඩ ලෙස කළුගල් බැම් බැඳීම හා ඉවත් කිරීම සඳහා රු.1,481,743 ක් ගෙවීම් කර තිබුණද, අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර, අතිරේක වැඩ සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීමක් හා කළුගල් බැම් සඳහා සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. බැවුම් සහිත මෙම ස්ථානයේ contour walls පාදම සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණය යොදා නොතිබුණු අතර, C බැම්ම සඳහා උස මීටර් 4.27 කට බිල් සකස් කර තිබුණි. භෞතිකව පරීක්ෂා කිරීමේදී එහි උස මීටර් 2.567 ක් වූයෙන් ඝන මීටර 18.62 ක් සඳහා රු.274,961 ක් වැඩියෙන් ගෙවා තිබුණි. බැම් සඳහා weep holes යොදා තිබුණද, ඒ සඳහා ගල් අසුරා පෙරවුම් මාධ්‍යය යොදා නොතිබුණි. SSR 02 යටතේ ව්‍යාපෘතියේ බැම්මක් ඉවත්කිරීම සඳහා අතිරේක වැඩ ලෙස සඳහන් කොට ඒ සඳහා රු.160,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. මෙම ඉවත්කළ බැම්මේ කළුගල් නව බැම්ම සඳහා යොදාගෙන තිබුණද, එය බිල් කිරීමේදී අඩුකර නොතිබුණි.

(iv) ඉදිකිරීම් නිමකර 2017 දෙසැම්බර් මස 27 දින සභාව වෙත පවරා දිය යුතු වුවත්, 2018 මාර්තු 24 දින වන විටත් ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පැවතුණු අතර, ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය
-------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) වැය විෂයන් 38 ක් සඳහා වෙන්කල රු.3,062,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) ආදායම් විෂයන් 17 ක් සඳහා ඇස්තමේන්තුගත රු.420,000 ක ආදායමෙන් කිසිදු මුදලක් උපයාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යෙ ාමු කළ යු ුතුය.

| **පද්ධතිය** | | **අඩුපාඩුව** |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් | (i) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර සියළුම වත්කම් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම. |
| | (ii) | ඇතැම් ස්ථාවර වත්කම් කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබීම. |
| (ආ) ගිණුම්කරණය | (i) | සභාව සතු සියළු වත්කම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| | (ii) | ඉදිකිරීම් ප්‍රාග්ධනිත නොකිරීම. |
| (ඇ) වාහන පාලනය | (i) | ආදායම් උත්පාදන වාහන වලින් ආදායම් උපයා ගැනීමට කටයුතු නොකිරීම |
| (ඈ) ආදායම් පාලනය | (i) | වෙළඳ සංකීර්ණවල කඩ කාමර තක්සේරු ක්‍රියාත්මක නොකිරීම. |
| | (ii) | වෙළඳ බලපත්‍ර ලබා දියයුතු ව්‍යාපාර පිළිබඳව වර්ෂය ආරම්භයේ සමීක්ෂණයක් නොපැවැත්වීම. |
| (ඉ) ණයගැතියෝ සහ ණයහිමියෝ | (i) | වසරකට වැඩි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

(ii) ණයහිමි ශේෂ පියවීමට කටයුතු කර නොතිබීම.

(ඊ) කොන්ත්‍රාත් පාලනය

(i) ඉදිකිරීම් අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම.
(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු නොකිරීම.
(iii) ව්‍යාපෘතිවලට අදාළ මිනුම්වල අඩුපාඩු පැවතීම.
(iv) ව්‍යාපෘති නිසි කාලයට නිම නොකිරීම.
(v) අසම්පූර්ණ ව්‍යාපෘති පැවතීම.